# වාණිජ ධාරා

## වාණිජ විෂයය ගුරුසිසු අත්වැල

(අධ්‍යාපන කාර්යාලය - බළන්ගොඩ)

## ගිණුම්කරණය - 33

### නිපුණතාව 02

ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ සමීකරණය ඇසුරින් ඉදිරිපත් කරයි


අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ

සම්පත් දායකත්වය : ගාමිණී හරිස්චන්ද්‍ර මයා

ර/ විද්‍යාලෝක මධ්‍ය මහා විද්‍යාලය



වාණිජ විෂයන් සඳහා ඉගෙනුම් ආධාරක ගොනු සැකසීමේ ව්‍යාපෘතිය

## 02) ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ සමීකරණය ඇසුරින් ඉදිරිපත් කරයි

| නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල |
|---|---|---|
| 2.1 ව්‍යාපාරයක වත්කම්, වගකීම් හා හිමිකම්වල එකතුවට සමාන වන ආකාරය විග්‍රහ කරයි | • ව්‍යාපාර ඒකක සංකල්පය<br>• ගනුදෙනු<br>• මූල්‍ය මිණුම් සංකල්පය<br>• ගිණුම්කරණ සමීකරණය හා එහි මූලිකාංග<br>• වත්කම්<br>• වගකීම්<br>• හිමිකම්<br>• ගනුදෙනු, වත්කම්, වගකීම් හා හිමිකම්වලට සිදු කරන බලපෑම | • ව්‍යාපාර ඒකක සංකල්පය පැහැදිලි කරයි.<br>• ව්‍යාපාර ඒකකයක "ගනුදෙනු"පැහැදිලි කරයි.<br>• මූල්‍ය මිණුම් සංකල්පය පැහැදිලි කරයි.<br>• ගිණුම්කරණ සමීකරණය ගොඩනගයි.<br>• ගනුදෙනු , වත්කම්, වගකීම් හා හිමිකම්වලට කරන බලපෑම ගිණුම්කරණ සමීකරණ ඇසුරින් ඉදිරිපත් කරයි. |
| 2.2 ව්‍යාපාරයක ගනුදෙනු හා සිද්ධීන් මගින් හිමිකම වෙනස්වන ආකාරය අනාවරණය කරයි. | • හිමිකම වෙනස්වීම<br>• හිමිකම වෙනස්වීමට බලපාන සාධක<br>• ලාභය හෝ අලාභය<br>• ආදායම<br>• වියදම<br>• අමතර ප්‍රාග්ධනය<br>• ගැනිලි<br>• ශුද්ධ වත්කම් ඇසුරින් ලාභය හෝ අලාභය ගණනය කරයි. | • හිමිකම වෙනස්වීමට බලපාන සාධක නම් කර, පැහැදිලි කරයි.<br>• හිමිකම/ශුද්ධ වත්කම් ගණනය කරයි.<br>• ශුද්ධ වත්කම් ඇසුරින් ලාභය හෝ අලාභය ගණනය කරයි. |
| 2.3 ගිණුම්කරණ සමීකරණය ඇසුරින් ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරයි. | • ගැළපුම් සංකල්පය<br>• ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හැඳින්වීම<br>• ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තතත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම. | • ගැළපුම් සංකල්පය පැහැදිලි කරයි.<br>• ආදායම් ප්‍රකාශනය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පැහැදිලි කරයි.<br>• ගිණුම්කරණ සමීකරණ ඇසුරින් ආදායම් ප්‍රකාශනය පිළියෙල කරයි.<br>• ගිණුම්කරණ සමීකරණය ඇසුරින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කරයි. |

**ව්‍යාපාරයක ගණුදෙනු හා සිද්ධීන් ගිණුම්කරණ සමීකරණය ඇසුරෙන් ඉදිරිපත් කරයි**

**සංකල්ප සිතියම**



වැදගත් කරුණු කීපයක්

- ගිණුම්කරණ ඒකක සංකල්පයට අනුව - ගිණුම් තැබීමේ දී **අයිතිකරුත්, ව්‍යාපාරයත් වෙන ම ඒකක දෙකක් ලෙස සලකන බව**
- ව්‍යාපාරවල **මුදලින් මැනිය හැකි සම්පත්වල වෙනස්කම්** පමණක් වාර්තා කරන බව.
- ව්‍යාපාරයේ අයිතිකරුවන් ව්‍යාපාරයට යොදවන සම්පත් **ප්‍රාග්ධනය** ලෙස හඳුන්වන අතර මෙය **හිමිකම** ලෙස හඳුන්වනු ලැබේ.
- අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවන විට බාහිර පාර්ශ්වයන්ගෙන් **ණයට මුදල් හෝ භාණ්ඩ තොග හෝ වෙනත් වත්කම්** ගැනීමට සිදු වේ. ඒ නිසා **වගකීම්** ඇතිවේ.
- ව්‍යාපාරයට **ප්‍රතිලාභ** ලබා දෙන **මුදලින් අගය කළ හැකි සම්පත්, වත්කම්** වේ.

- ව්‍යාපාරයේ අයිතිකරු පමණක් සම්පත් යොදවා ඇතිනම්

ගිණුම්කරණ සමීකරණය

**වත්කම් = හිමිකම්**

- අයිතිකරුවන් ව්‍යාපාරයට සම්පත් යොදවා ඇති විට හා බාහිර පාර්ශ්වයන් සම්පත් යොදවා ඇති විට ව්‍යාපාරයේ ගිණුම්කරණ සමීකරණය

**වත්කම් = හිමිකම් + වගකීම්**

**(සමීකරණ අභ්‍යාස අංක 01)**

:

සංඛ සිල්ලර වෙළෙඳසැලක් කර ගෙන යන ව්‍යාපාරිකයෙකි. ඔහු ව්‍යාපාර කටයුතු 2020 වසරේ ජනවාරි 01 දින ඇරඹීය. මේ සඳහා ඔහුට පිය උරුමයෙන් ලද රු. 2 000 000 ක් වටිනා ගොඩනැගිල්ලක් හා ඔහු ඉතිරි කර ගත් රු. 1000 000 ක් යොදවන ලදී. ඔහු සතු රු. 500 000 ක ඉතුරුම් තැන්පතුව ව්‍යාපාරයට යොදවා නැත. ව්‍යාපාරික කටයුතු පුළුල් කිරීම සඳහා රු. 4000 000 බැංකු ණයක් ලබා ගත් අතර කළමනාකරණ උපාධියක් සහිත සේවකයකු බඳවා ගන්නා ලදී.

**<u>ඉදිරිපත් කරන ප්‍රශ්න</u>**

- සංඛ සිය ව්‍යාපාරය සඳහා **යෙදවිය හැකි** සම්පත් වටිනාකම් සහිත ව දක්වන්න.

......................................................................................................................

- එම සම්පත්වලින් සිය ව්‍යාපාරික කටයුතුවලට **යොදවා ඇති** සම්පත්

වටිනාකම් සහිත ව දක්වන්න ..........................................................................................

- සංඛ සිය ව්‍යාපාරික කටයුතු කර ගෙන යාමට යොදවන ලද සම්පත්

පහත ශීර්ෂ යටතේ වර්ග කරන්න.

1. මුදලින් අගය කළ හැකි සම්පත් .........................................................................................

2. මුදලින් අගය කළ නොහැකි සම්පත් ..................................................................................

- ව්‍යාපාරය සඳහා බාහිර පාර්ශ්වයන්ගෙන් ලබා ගත් සම්පත්, වටිනාකම්

සහිත ව දක්වන්න. ...................................................................................................................

- අතීත සිදුවීමක ප්‍රතිඵලයක් මත බිහි වී ඇති,අනාගත ආර්ථික ප්‍රතිලාභ ගලා එන ව්‍යාපාරය විසින් පාලනය කරන සම්පත් වත්කමකි.
- අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් මත බිහි වී ඇති, නිරාකරණය කිරීමේ දී සම්පත් පිටතට ගලා යන, වර්තමාන බැදීම් වගකීමකි.
- ව්‍යාපාරික ගනුදෙනු හා සිද්ධීන්, වත්කම් වගකීම් හා හිමිකම්වලට ඇති කරන ද්විත්ව බලපෑම පහත අයුරින් සාරාංශ කරන බව.

| ගනුදෙනු අංකය | හිමිකම් + වගකීම් = වත්කම් | ද්විත්ව ප්‍රතිඵලය |
|---|---|---|
| (01) | = — + | එක් වත්කමක් අඩු වී, වෙනත් වත්කම් වැඩි වීම |
| (02) | + = + | වත්කම් වැඩි වී වගකීම් වැඩි වීම. |
| (03) | — = — | වත්කම් අඩු වී වගකීම් අඩු වීම |
| (04) | + = + | වත්කම් වැඩි වී හිමිකම් වැඩි වීම. |
| (05) | — = — | වත්කම් අඩු වී හිමිකම් අඩු වීම. |
| (06) | + — = | වගකීම් අඩු වී හිමිකම් වැඩිවීම. |
| (07) | — + = | වගකීම් වැඩි වී හිමිකම් අඩුවීම |

**වත්කම් සඳහා උදාහරණ ලෙස**

ජංගම නොවන වත්කම්:
- ඉඩම්
- ගොඩනැගිලි
- මෝටර් රථ
- ගෘහ භාණ්ඩ
- පරිගණක
- යන්ත්‍රෝපකරණ

ජංගම වත්කම්:
- ඉතුරුම් තැම්පතු
- භාණ්ඩ තොගය
- වෙළඳ ලැබියයුතු දෑ
- ලැබියයුතු ආදායම්
- ඉදිරියට කළ ගෙවීම්
- මුදල් ශේෂය/ බැංකු ශ්ෂය

**වගකීම් සඳහා උදාහරණ**

බැංකු ණය

වෙළඳ ගෙවියයුතු දෑ

උපචිත වියදම්

කලින් ලද ආදායම්

බැංකු අයිරාව

**හිමිකම් සඳහා උදාහරණ**

ප්‍රාග්ධනය

ලාභ (ශුද්ධ ලාභය)

සංචිත ( ප්‍රත්‍යාගනන සංචිත/පොදු සංචිතන)

**(සමීකරණ අභ්‍යාස අංක 02)**

**සිද්ධිය '' දුල්ෂා සිල්ලර වෙළෙඳ සැල ''**

| | |
|---|---|
| 01/01 | දුල්ෂා 2020/01/01 දින තමා සතු මුදල් රු. 600 000 ක්ද, රු. 900 000 ක් වටිනා මෝටර් රථය ද යොදවා සිල්ලර වෙළඳසැලක් ඇරඹීය. |
| 01/02 | විකිණීම සඳහා රු. 120 000 ක බඩු තොග අත්පිට මුදලට ලබා ගන්නා ලදී. |
| 01/03 | ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා රු. 100 000 ක් වටිනා ලී බඩු හා සවි කිරීම් ලක්දිව ලී බඩු සමාගමෙන් ණයට ලබා ගන්නා ලදී. |
| 01/04 | මාසික ව රු. 10 000 ක වැටුපක් ගෙවීමේ පොරොන්දුව මත සේවකයකු බඳවා ගන්නා ලදී. |
| 01/05 | ව්‍යාපාරයේ මෝටර් රථය සඳහා රු. 15 000 ක ඉන්ධන වියදම් ගෙව්වා. |
| 01/06 | ලක්දිව ලී බඩු සමාගමට රු. 30 000 ක මුදලක් ගෙව්වා. |
| 01/07 | දුල්ෂාගේ නිවස සොරු බිඳීමෙන් රු. 130 000 ක හානියක් සිදු විය. |

ඉහත ගනුදෙනු **හිමිකම් + වගකීම් = වත්කම්** යන මූලික සමීකරණයට ආදේශ කර පෙන්වන්න

**(සමීකරණ අභ්‍යාස අංක 03)**

(01) පහත සඳහන් ගනුදෙනු අතරින් ව්‍යාපාරයේ හිමිකමට බලපාන ගනුදෙනු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) අශාන් මුදලින් රු. 1 500 000 ක් යොදා ව්‍යාපාරයක් ඇරඹීම.

(ii) අශාන්ට පිය උරුමයෙන් ලද රු. 1000 000 ක් වටිනා ගොඩනැගිල්ලක් ව්‍යාපාරයේ කටයුතු සඳහා යෙදවීම.

(iii) ව්‍යාපාරයේ කටයුතු සඳහා රු. 800 000 කට මෝටර් රථයක් මිල දී ගැනීම

(iv) ව්‍යාපාරයේ ප්‍රයෝජනය පිණිස රු. 100 000 ක උපකරණ කමල්ගෙන් ණය ගැනීම.

(v) නැවත විකිණීම සඳහා රු. 40 000 ක බඩු තොග අත්පිට මුදලට ගැනීම.

(02) පහත සඳහන් ගනුදෙනු අතුරින් හිමිකම හා වත්කම අඩුවීමට බලපාන ගනුදෙනුව තෝරන්න.

(i) බැංකුවෙන් රු. 200 000 ක ණයක් ගැනීම.

(ii) රු. 50 000 ක තොගයක් අත්පිට මුදලට ගැනීම.

(iii) අයිතිකරුගේ භාණ්ඩ ගැනිලි රු. 10 000 කි.

(iv) බැංකුවෙන් ගත් ණය මුදලින් රු. 30 000 ක් ගෙවීම

(v) රු. 40 000 ක භාණ්ඩ ණයට ගැනීම.

(03) පහත සඳහන් ප්‍රකාශ අතුරින් එකක් හැර අනෙක් ඒවා නිවැරදි වේ. වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) අයිතිකරුවන් හැර වෙනත් පාර්ශ්වයන් බාහිර පාර්ශ්වය ව්‍යාපාර සම්පත් සඳහා දායක වී නොමැති විට ගිණුම්කරණ සමීකරණය වත්කම් = හිමිකම් වේ.

(ii) ව්‍යාපාරයකට, එහි අයිතිකරුගෙන් හා ඔහුට අයත් වෙනත් ව්‍යාපාරවලිනුත්, වෙන් වූ ස්වාධීන පැවැත්මක් ඇත.

(iii) මූල්‍ය මිනුම් සංකල්පයෙන් අදහස් වන්නේ මුදලින් අගය කළ හැකි සම්පත් පමණක් වාර්තාකරණ බවයි.

(iv) ව්‍යාපාරයක වත්කම් වෙනස්වන විට හිමිකම් අඩුවීමක් හෝ වැඩිවීමක් සිදු වේ.

(v) ව්‍යාපාරයක වගකීම් වෙනස්වීම, වත්කම්වලින් මෙන් ම හිමිකමේ බලපෑමෙනුත් සිදු වේ.

(04) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය නම් (√) ලකුණ ද අසත්‍ය නම් (x) ලකුණ ද යොදන්න.

(i) ව්‍යාපාර ඒකක සංකල්පය ගිණුම් තැබීමේ දී අදාළ කර ගත යුතුයි. (....)

(ii) ව්‍යාපාරයක් මඟින් අයිතිකරුගේ පෞද්ගලික වියදම් ගෙවිය යුතු ය. (....)

(iii) වත්කම් වෙනස් වන්නේ හිමිකමේ හෝ වගකීම්වල බලපෑමෙන් පමණි. (....)

(iv) අයිතිකරුට මූලික ව යොදවන ප්‍රාග්ධනයට අමතරව පසුව ප්‍රාග්ධනය යෙදිය නොහැකි ය. (....)

(v) අයිතිකරුවෙකුට ව්‍යාපාර කීපයක් ඇති විට එම සියල්ල ම එකම ව්‍යාපාරයක් ලෙස සලකා ගිණුම් තැබීම සුදුසු ය. (....)

(05) ජානිත්‍යා 2020 ජනවාරි 01 දින ව්‍යාපාරයක් ඇරඹීමට යෙදූ වත්කම් හා පළමු සතිය තුළ සිදු වූ ගනුදෙනුවල ද්විත්ව බලපෑම සමීකරණයක ස්වරූපයෙන් පහත දැක්වේ.

(රු. 000)

| ගනුදෙනු | | වත්කම් | = | හිමිකම් | + | වගකීම් |
|---|---|---|---|---|---|---|
| (i) | ඉඩම් ගොඩනැගිලි | + 5 000 | | | | |
| | මෝටර් රථය | + 2 000 | | | | |
| | මුදල් | + 1 000 | = | 8 000 | + | - |
| (ii) | මුදල් | - 500 | | | | |
| | බඩු තොග | + 500 | = | | + | |
| (iii) | කාර්යාල උපකරණ | + 300 | = | | + | |
| | මුදල් | - 300 | | | | |
| (iv) | මුදල් | + 800 | = | | + | 800 බැංකු ණය |
| (v) | මුදල් | - 200 | = | - 200 (හිමිකම) | + | |

අවශ්‍ය වන්නේ :

1. ඉහත එක් එක් ගනුදෙනුව වටිනාකම් සහිත ව විස්තර කිරීම.
2. පළමු සතිය අවසානයේ මුළු වත්කම් මුළු වගකීම් හා මුළු හිමිකම් එකතු කර දැක්වීම.

(06) තුෂාන්ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි 01 දිනට ගිණුම් ශේෂ පහත දැක්වේ.

| | (රු. 000) |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | රු. 4 000 |
| බස්රථය | රු. 2 000 |
| මුදල් | රු. 500 |
| බැංකුණය | රු. 1 500 |

ජනවාරි මාසයේ පළමු සතියේ ගනුදෙනු පහත දැක්වේ (000)

1. රු. 50ක මුදල් ගෙවා භාණ්ඩ තොගයක් ගැනීම.
2. බැංකු ණයෙන් කොටසක් පියවීමට රු. 500 ක් දුන්නා.
3. රු. 250 ක බඩු තොගයක් චතුරගෙන් ණයට ගත්තා.
4. භාණ්ඩවල සන්නම වෙනස්වීම නිසා රු. 25ක තොග චතුරට ආපසු යැවුවා.
5. තුෂාන් පුද්ගලික ප්‍රයෝජනයට ගත් මුදල රු. 50

**අවශ්‍ය වන්නේ :**

1. වත්කම් = හිමිකම් + වගකීම් සමීකරණයේ ඉහත ගනදෙනු වටිනාකම සමග දක්වීම..

2. ගනුදෙනු අවසානයේ මුළු හිමිකම, මුළු වත්කම් හා මුළු වගකීම් ගණනය කර දක්වීම.

(07) නිමගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි 01 දිනට ගිණුම් ශේෂ පහත දක්වේ.

| | (රු. 000) |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | රු. 5 000 |
| මෝටර් රථය | රු. 3 000 |
| මුදල් | රු. 600 |
| බැංකුණය | රු. 2 500 |

ජනවාරි මාසයේ පළමු සතියේ ගනුදෙනු පහත දක්වේ (000)

1. රු. 100 ක මුදල් ගෙවා භාණ්ඩ තොගයක් ගැනීම.

2. බැංකු ණයෙන් කොටසක් පියවීමට රු. 600 ක් දුන්නා.

3. රු. 250 ක බඩු තොගයක් නිමල්ගෙන් න් ණයට ගත්තා.

4. භාණ්ඩවල සන්නම වෙනස්වීම නිසා රු. 30 ක තොග නිමල්ට ආපසු යැවුවා.

5. නිමා පුද්ගලික ප්‍රයෝජනයට ගත් මුදල රු. 60

6. රු. 150 ක් වටිනා බඩු තොගයක් අනුරට ණයට වික්කා

7. රු. 20 අනුරට විකුණු බඩුවලින් කොටසක් පලුදු වීම හේතුවෙන් ආපසු එවා තිබුනා

**අවශ්‍ය වන්නේ :**

1. වත්කම් = හිමිකම් + වගකම් සමීකරණයේ ඉහත ගනදෙනු වටිනාකම සමග දක්වීම..

2. ගනුදෙනු අවසානයේ මුළු හිමිකම, මුළු වත්කම් හා මුළු වගකීම් ගණනය කර දක්වීම.

## (සමීකරණ අභ්‍යාස අංක 04)

සිරිමල්ගේ වනපාරයේ 2020 -01-01 ට පැවති වත්කම් හා වගකීම පහත දක්වේ. (රු000)

| | |
|---|---|
| දේපල පිරියත උපකරණ | රු. 3000 |
| භාණ්භ තොග | රු. 400 |
| වෙළඳ ලැබිය යුතු දෑ. | රු 350 |
| මුදල් | රු. 1000 |
| වෙළඳ ගෙවිය යුතු දෑ | රු. 150 |

| | |
|---|---|
| බැංකු ණය | රු. 500 |

ජනවාරි මාසයේ සිදුවූ ගණුදෙණු පහත දැක්වේ (රුපියල් වලින්)

01-02. රු. 50 000 භාණ්භ තොගයක් කමල්ගෙන් ණයට ගැනීම

01-04. පිරිවැය රු. 100 000 ක භාණ්ඩ රු. 130 000 කට ඇල්පාට ණයට විකිනීම

01-05. රු. 20 000 ක රක්ෂණ වාරිකයක් මුදලින් ගෙවීම

01-10. රු. 80 000 ක වෙළඳ ගෙවිය යුතු දෑ පියවීමට රු. 75 000 ක් ගෙවීම

01-15. රු. 100 000 ක වෙළඳ ලැබිය යුතු දෑ වෙනුවෙන් රු 92 000 ක් ලැබීම.

01-20. රු 80 000 ක පිරිවැය වූ භාණ්ඩ තොග රු 120 000 කට අත්පිට විකිණීම.

01-24. ජනවාරි මාසයට අදාල ලැබිය යුතු කුලී ආදායම රු 80 000 කි.

01-27. වෙළඳ ලැබියයුතු දෑ මත කපාහල බොල්ණය රු 20 000 යි.

01-28. දේපල පිරියත උපකරණ වාර්ෂික ක්ෂය වීම් 10% කි.

01-30. අයිති කරුගේ මුදල් ගැනිලි රු 50 000 ක් හා භාණ්ඩ ගැනිලි රු 25 000 කි.

අවශ්‍ය වන්නේ

01) ඉහත දැක්වෙන ගණුදෙනු **වත්කම්= හිමිකම්+වගකීම්** යන සමීකරණයට ආදේශ කරන්න? ජනවාරි 31 ට වත්කම් , වගකීම්, හිමිකම් වටිනාකම දක්වන්න?

02) ඉහත දැක්වෙන ගණුදෙනු

**දේපල පිරියත උපකරණ+ තොගය +වෙළඳ ලැබිය යුතු දෑ+ මුදල් = බැංකු ණය +වෙළඳ ගෙවියයුතු දෑ+ ප්‍රාග්ධනය** යන සමීකරණයට ආදේශ කරන්න?

### (සමීකරණ අභ්‍යාස අංක 05)

සමන්ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි 01 දිනට ගිණුම් ශේෂ පහත දැක්වේ.

| | (රු. 000) |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | රු. 6 000 |
| මෝටර් රථය | රු. 3 000 |
| ගෘහ භාණ්ඩ | රු. 1 000 |
| පරිගණක | රු. 500 |
| මුදල් | රු. 2 000 |

ජනවාරි මාසයේ පළමු සතියේ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ (000)

1. රු. 100 ක මුදල් ගෙවා භාණ්ඩ තොගයක් ගැනීම.

2. බැංකු ණයෙන් කොටසක් පියවීමට රු. 600 ක් දුන්නා.

3. රු. 300 ක බඩු තොගයක් නිමල්ගෙන් න් ණයට ගත්තා.

4. භාණ්ඩවල සන්නම වෙනස්වීම නිසා රු. 30 ක තොග නිමල්ට ආපසු යැවුවා.

5. සමන් පුද්ගලික ප්‍රයෝජනයට ගත් මුදල රු. 50

6. රු. 150 ක් වටිනා බඩු තොගයක් අනුරට ණයට වික්කා

7. රු. 20 අනුරට විකුණූ බඩුවලින් කොටසක් පලුදු වීම හේතුවෙන් ආපසු එවා තිබුනා

8. රු 70 ක භාණ්ඩ රු 100 කට අත්පිට වික්කා

9. අනුරගෙන් ලැබිය යුතු ණයවලින් රු 70 ක් වෙනුවෙන් රු. 65 ක් ලබා ගැනීම ඉතිරිය දුන් වට්ටම් විය

10. නිමල්ට ගෙවිය යුතු ණයවලින් රු 150 ක් පියවීම සඳහා රු 140 ක් මුදලින් ගෙවීම එහිදී ලද වට්ටම

රු 10 කි

**අවශ්‍ය වන්නේ :**

1. වත්කම් = හිමිකම් + වගකීම් සමීකරණයේ ඉහත ගනදෙනු වටිනාකම සමග දැකවීම..

2. ගනුදෙනු අවසානයේ මුළු හිමිකම, මුළු වත්කම් හා මුළු වගකීම් ගණනය කර දැක්වීම.

## (සමීකරණ අභ්‍යාස අංක 06)

සාමෙල්ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි 01 දිනට ගිණුම් ශේෂ පහත දැක්වේ.

| | |
|---|---|
| ඉඩම් හා ගොඩනැගිලි | රු. 15 00 000 |
| මෝටර් රථය | රු. 10 00 000 |
| මුදල් | රු. 600 000 |
| බැංකුණය | රු. 500 000 |

ජනවාරි මාසයේ සිදුවූ ගනුදෙනු පහත දැක්වේ

1. රු. 100 000 ක මුදල් ගෙවා භාණ්ඩ තොගයක් ගැනීම.
2. බැංකු ණයෙන් කොටසක් පියවීමට රු. 40 000 හා පොලිය රු 5000 ක් ගෙවීම.
3. රු. 250 00 ක බඩු තොගයක් නිමල්ගෙන් න් ණයට ගැනීම
4. රු 40 000 ක භාණ්ඩ 60 000 කට ණයට විමල්ට ණයට විකිනීම
5. සේවක වේතන රු 15 000 ක් ගෙවීම
6. ගොඩනැගිල්ලක් කුලියට දීමෙන් රු 15 000 ක කුලියක් ලැබීම
7. විමල්ගෙන් ලැබිය යුතු ණයවලින් රු 30 000 ක් සඳහා රු 28 000 ක් ලැබීම
8. රු 70000 ක භාණ්ඩ කුමාරගෙන් ණයට ගැනීම
9. ව්‍යාපරයේ විදුලි බිල රු 12000 ක් මුදලින් ගෙවීම

10. කුමාරට ගෙවිය යුතු ණයවලින් රු 30000 ක් සඳහා රු 27 000 ක් ගෙවීම
**අවශ්‍ය වන්නේ :**
1. පහත දැක්වෙන සමීකරනයේ දක්වා ජනවාරි මාසයේ ලාභය හෝ අලාභය ගණනන කර මුළු වත්කම්, මුළු වගකීම්, හා මුළු හිමිකම ගණනය කර පෙන්වන්න

| **ගණුදෙනු අංකය** | **වත්කම්** | **ප්‍රාග්ධනය/ හිමිකම** | **ආදායම්** | **වියදම්** | **වගකීම්** |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

(සමීකරණ අභ්‍යාස අංක 07)

| ගණුදෙනුව | වත්කම් | ප්‍රාග්ධනය/ හිමිකම | ආදායම් | වියදම් | වගකීම් |
|---|---|---|---|---|---|
| 1 | මුදල් +500 000<br>දේපල පිරි. උපකරන +700 000 | +1200 000 | | | |
| 2 | භාණ්ඩ +100 000 | | | | +100 000 |
| 3 | භාණ්ඩ -20 000<br>මුදල් +30 000 | | +30 000 | +20 000 | |
| 4 | මුදල් -12 000 | | | විදුලි ගාස්තු +12 000 | |
| 5 | භාණ්ඩ -25 000<br>ණයගැතියෝ +40 000 | | +40 000 | +25 000 | |
| 6 | මුදල් - 27 000 | | +3000 | | -30 000 |
| 7 | ණයගැතියෝ -20 000<br>මුදල් +18 000 | | | +2000 | |
| 8 | මුදල් +15 000 | | කොමිස් + 15 000 | | |
| 9 | | | | දුරකථන+5000 | +5000 |
| 10 | භාණ්ඩ -7000<br>මුදල් -5000 | -12000 | | | |

එක්එක් ගණුදෙනුව විස්තර කරන්න

1 ..........................................................................................................

2 ..........................................................................................................

3..........................................................................................................

4 ..........................................................................................................

5 ..........................................................................................................

6 ..........................................................................................................

7 ..........................................................................................................

8 ..........................................................................................................

9 ..........................................................................................................

10 ..........................................................................................................

**(සමීකරණ අභ්‍යාස අංක 08)**

01. ව්‍යාපාරික හිමිකම වෙනස්වීමට බලපාන ගනුදෙනු පමණක් ඇතුළත් පිළිතුර තේරීම.

A - අයිතිකරු සතු රු. 400 000 ක ඉඩම් හා ගොඩනැගිල්ල ව්‍යාපාර කටයුතු සඳහා යෙදීම.

B - අයිතිකරුගේ නිවසේ දුරකතන බිල රු. 50 000 ක් ව්‍යාපාර මුදලින් ගෙවීම

C - ව්‍යාපාරයේ විදුලිය ගාස්තු රු. 150 000 ක් ගෙවීම

D - ව්‍යාපාරයේ ප්‍රයෝජනය පිණිස රු. 100 000 ක් ගෙවා පරිගණකයක් මිලට ගැනීම

E - ව්‍යාපාරයේ ස්ථාවර තැන්පතුවක් සඳහා පොළිය වශයෙන් රු. 20 000 ක් ලැබීම

(I) ABDE (II) ABCD (III) ABCE (IV) BCDE (V) ABC පමණි.

(02) පහත සඳහන් ප්‍රකාශවල හිස්තැනට ගැලපෙන වචනය පහත දී ඇති යෙදුම් අතරින් තෝරා ලිවීම.
(යෙදුම් ෑ ගැනිලි, වියදම, ආදායම්, හිමිකම, අමතර ප්‍රාග්ධනය)

(i) පවත්වා ගෙන යන ව්‍යාපාරයකට අතිරේක ව අයිතිකරුවන් යොදවන සම්පත් ......................... ලෙස හැඳින්වේ. මෙමගින් හිමිකම වැඩි කරයි.

(ii) ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යාමේ දී විවිධ වූ ................................. දැරීමට සිදු වේ. මෙමගින් හිමිකම අඩු වේ.

(iii) ව්‍යාපාරයේ අයිතිකරු ව්‍යාපාරයෙන් ඉවත් කර ගන්නා සම්පත්වල මූල්‍ය වටිනාකම ...................... ලෙස හැඳින්වේ. මෙවැනි ගනුදෙනු නිසා හිමිකම අඩු වේ.

(iv) ව්‍යාපාරයේ විවිධ මෙහෙයුම් කටයුතු / ක්‍රියාකාරකම් නිසා විවිධ ඉපයීම් ලැබේ. මේවා ........................ ලෙස හැඳින්වේ. මෙවැනි ගනුදෙනු නිසා හිමිකම වැඩි වේ.

(v) ව්‍යාපාරයේ අයිති කරුවන්ට ව්‍යාපාරය සම්බන්ධ ව ඇති අයිතිය .............................. ලෙස හැඳින්වේ.

(03) පහත සඳහන් ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද යෙදීම.

(i) ආදායම් මඟින් ව්‍යාපාර හිමිකම වැඩි වේ. ...........

(ii) අමතර ප්‍රාග්ධනය යෙදීමෙන් හිමිකම වෙනස් නොවේ. ...........

(iii) ආදායම් ඉපයීමේ දී විවිධ වියදම් දැරීමට සිදු වේ. ...........

(iv) බැංකු ණයක් ගැනීමෙන් හිමිකම පමණක් වැඩි වේ. ...........

(v) ගැනිලි සිදු කිරීම නිසා ව්‍යාපාරයේ වියදම් වැඩි වේ. ...........

## (සමීකරණ අභ්‍යාස අංක 09)

01) අෂේන්ගේ ව්‍යාපාරයේ 2020/01/01 දිනට පැවති වත්කම් හා වගකීම් පහත දැක්වේ.
(සංඛ්‍යා 000 වලිනි)
ඉඩම් ගොඩනැගිලි රු. 5 000, මෝටර් රථ රු. 3 000, ස්ථාවර තැන්පතුව රු. 2 000
බඩු තොගය රු. 1 000, මුදල් ශේෂය රු. 1 500, බැංකු ණය රු. 2 000

2020 ජනවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනුවල සාරංශය පහත දැක්වේ. (රු. 000 වලිනි)

1. පිරිවැය 400 ක බඩු තොග රු. 600 ක අත්පිට මුදලට විකිණීම
2. සේවක වේතන ගෙව්වා රු. 100 යි.
3. රු. 500 ක බඩු තොග රසිකාගෙන් ණයට ගැනීම
4. රු. 200 ක තොග රු. 300 ට ඉමාෂාට ණයට විකිණීම
5. අෂේන් නිවසේ පැවති දානමය කටයුත්තට රු. 30 ක බඩු තොගයක් ව්‍යාපාරයෙන් රැගෙන යෑම.
6. ජනවාරි මාසයට අදාළ ව ලැබුණ විදුලි බිල රු. 25
7. බැංකු ණය වාරිකය රු 25 හා ක් හා පොළී ගෙව්වා රු. 5 යි.

**අවශ්‍ය වන්නේ :**
1. වත්කම් = හිමිකම් + වගකීම් යන සමීකරණයට ඉහත ගනුදෙනු මඟින් සිදුවන බලපෑම
+ / - වශයෙන් (වටිනාකම සමග) ලිවීම.
2. වත්කම් = හිමිකම් + (ආදායම් - වියදම්) + වගකීම් සමීකරණයට ඉහත ගනුදෙනු මඟින් සිදු වන බලපෑම + / - වශයෙන් වටිනාකම සමග ලිවීම.
3. ඉහත දැක් වූ ආදායම් හා වියදම් ඇසුරෙන් 2017 ජනවාරි මාසයට අදාළ ව ලාභය /අලාභය ගණනය කිරීම.
4. ශුද්ධ වත්කම් ඇසුරෙන් 2018 ජනවාරි මාසයේ ලාභය / අලාභ ගණනය කිරීම.

02) සුධාරකගේ ව්‍යාපාරයේ 2020/01/01 දිනට හා 2020/12/31 දිනට හිමිකම් හා හිමිකම වෙනස්වීමට බලපෑ ගනුදෙනු සමහරක් පහත දැක්වේ.

| | (රු.000) |
|---|---|
| 2020/01/01 දිනට හිමිකම | 8 000 |
| 2020/12/31 දිනට හිමිකම | 10 000 |

- සධුාරක වසර තළු මදලින් රු. 500 ක් හා රු. 200 ක් වටිනා භාණ්ඩ නිවසේ ප්‍රයෝජනයට ගෙන ඇත.
- වසර තුළ සුධාරක රු. 800 ක් වටිනා මෝටර් රථයක් ව්‍යාපාරයේ කටයුතු සඳහා යොදවා ඇත.

අවශ්‍ය වන්නේ :

1. ශුද්ධ වත්කම් ඇසුරෙන් සුධාරකගේ ව්‍යාපාරයේ 2017 වසරේ ලාභය හෝ අලාභය ගණනය කිරීම.

**(සමීකරණ අභ්‍යාස අංක 10)**

දුමිඳුගේ ව්‍යාපාරයේ 2020/01/01 දිනට පැවති වත්කම් හා වගකීම් පහත දක්වේ.

| | (රු.000) | | (රු.000) |
|---|---|---|---|
| **වත්කම්** ඉඩම් හා ගොඩනැගිලි | 7 000 | **වගකීම්** බැංකු ණය | 2 500 |
| මෝටර් රථ | 3 000 | ණයහිමියෝ | 500 |
| බඩු තොගය | 600 | | |
| ණයගැතියෝ | 300 | | |
| මුදල් | 100 | | |

- පහත දක්වෙන්නේ ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනුවල සාරාංශයයි. (රු. 000')
    1. රු. 300 ක භාණ්ඩ රු. 500 කට අත්පිට විකිණීම.
    2. මෝටර් රථ මාසික ක්ෂය රු. 50 යි.
    3. රු. 400 ක මුදලක් දුමිඳු ව්‍යාපාරයට යෙදවීම.
    4. රු. 400 භාණ්ඩ රු. 600 කට ණයට විකිණීම.
    5. දුමිඳුගේ භාණ්ඩ ගැනිලි රු. 100 යි.
    6. පරණ පත්තර අලෙවියෙන් ලැබුණා. රු. 10 යි.
    7. ණයගැතියන්ගෙන් රු. 500 ක් පියවීමට ලද මුදල රු. 450 යි. දුන් වට්ටම් රු. 50කි.
    8. ණයහිමියන්ට රු. 300 ක් ගෙව්වා. ණයහිමියන්ගෙන් ලද වට්ටම රු. 30 කි

1. ඉහත ගනුදෙනුවල බලපෑම පහත දැක්වෙන ආකාරයේ සමීකරණයක ආරම්භක ශේෂය සහිත ව සටහන් කිරීමට යොමු කරන්න.

ඉඩම් හා + මෝටර් රථ + තොගය + ණයගැති = බැංකු ණය + ණය හිමියෝ + හිමිකම්
ගොඩනැගිලි

2. එක් එක් තීරුවල එකතුව පහළට එකතු කරන්න
3. ආරම්භක දිනට හිමිකම (2020/01/01) හා අවසාන හිමිකම (2020/01/31) අතර වෙනස කීයද
4. එම වෙනස තුළ ඇතුළත් අයිතම පහත නිර්නායක මත දක්වන්න

    ආදායම්/ වියදම්/ ගැනිලි / අමතර ප්‍රාග්ධනය